# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2138/29 - 2019 අගෝස්තු මස 28 වැනි බදාදා - 2019.08.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(2) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් 20% ක විනෝද බද්දක් පනවා අයකිරීමටත්, එසේ වුවද නගර සභා බල ප්‍රදේශය තුළ සිනමා ශාලා තුළ පෙන්වනු ලබන චිත්‍රපට සංදර්ශන සඳහා ඇතුල්වීමේ ගාස්තුවෙන් 7.5% ක විනෝද බද්දක් පනවා අය කිරීමට 1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ 2(1) වගන්තියේ සඳහන් විධිවිධාන සමඟ කියවිය යුතු නගර සභා ආඥා පනතේ 184 (අ) වගන්තිය ප්‍රකාරව කළුතර සභාවේ ලේකම්ගේ තීරණ අංක 2583 දරන 2017.11.02 දිනැති තීරණය, බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය ඉසුර දේවප්‍රිය වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(2) වගන්තියේ විධිවිධාන අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

**ඉසුර දේවප්‍රිය,**
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍ය,
මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය,
පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන,
විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා
ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

2019 අප්‍රේල් මස 12 වැනි දින,
අංක 204,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ලේ,
පළාත් සභා ගොඩනැගිල්ලේ දී ය.

09 - 383

1A - PG4630— 13 (2019/08)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*